# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 2171635 - 10120
ෆැක්ස් / தொலைநகல / Fax: 011-
දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1335/ 2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024
දිනය / திக / Date: 17/08/2024 පැය 1335

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - දෙහිඅත්තකණ්ඩිය පොලිස් වසම.

2024.08.17 වන අද දින උදෑසන කාලයේ දෙහිඅත්තකණ්ඩිය පොලිස් වසමේ දමනේවෙල ප්‍රදේශයේ කාන්තාවක් ඝාතනය කර ඇති බවට දෙහිඅත්තකණ්ඩිය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 50 ක් වූ දමනේවෙල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය හා ඇගේ සැමියා අතර ඇති වූ පුද්ගලික ආරවුලක් මත සැමියා විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය දෙහිඅත්තකණ්ඩිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සිද්ධියට සම්බන්ධ වයස අවුරුදු 53 ක් වන සැකකාර සැමියා අත්අඩංගුවට ගෙන ඇති අතර දෙහිඅත්තකණ්ඩිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. වන අලියෙකු පහර දීමෙන් පුද්ගලයෙකු මියයාම - නිකවැරටිය පොලිස් වසම.

2024.08.16 වන දින රාත්‍රී කාලයේ නිකවැරටිය පොලිස් වසමේ ඉබ්බාවල ප්‍රදේශයේදී පුද්ගලයෙකු වන අලි ප්‍රහාරයකට ලක්ව බරපතල තුවාල ලබා නිකවැරටිය මූලික රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මිය ගොස් ඇති බවට නිකවැරටිය පොලිසියට ලද තොරතුරක් මත විමර්ශණ ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 75 ක් වූ ඉබ්බන්වල, නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම අය තම නිවස ඉදිරිපිට මාර්ගයේ සිටියදී මෙම අනතුරට මුහුණ පා ඇති බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය නිකවැරටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නිකවැරටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් ස්ථානය.

2024.08.17 වන අද දින අළුයම් කාලයේදී ගම්පහ පොලිස් වසමේ උඩුගම්පොල ප්‍රදේශයේදී ගම්පහ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 792 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ගම්පහ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 18 ක් වන උඩුගම්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.08.16 වන දින දහවල් කාලයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්ටේස් මාවතේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 790 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන කොළඹ අපරාධ කොට්ඨාසය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 38 ක් වන ග්‍රෑන්ඩ්පාස්, කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - අඟුණකොළපැලැස්ස පොලිස් වසම.

2024.08.17 වන අද දින උදෑසන කාලයේ අඟුණකොලපැලැස්ස පොලිස් වසමේ බරවකුඹුක අධිවේගී මාර්ගය ආසන්නයේදී නෝනාගම දෙස සිට ඇඹිලිපිටිය දෙසට ධාවනය වූ ලොරි රථයක් පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා චන්ද්‍රිකාවැව රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය චන්ද්‍රිකා වැව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර අඟුණකොළපැලැස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - නාල්ල පොලිස් වසම.

2024.08.17 වන අද දින උදෑසන කාලයේ නාල්ල පොලිස් වසමේ මාර්ග අංක 05, කොළඹ කුරුණෑගල මාර්ගයේ මංචිකඩේ හන්දිය ආසන්නයේදී කොළඹ දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය වූ බස් රථයක කුරුණෑගල දෙස සිට දිවුලපිටිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට වේගය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ පෙරළී ගොස් බස් රථයේ පිටුපස රෝදයට හසු වීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු රෝහලට රැගෙන යාමින් සිටියදී මිය ගොස් ඇත. පසුපැදිකරු තුවාල ලබා ප්‍රතිකාර සඳහා දඹදෙණිය රෝහලට ඇතුලත් කර ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක් වූ ගොනාවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දඹදෙණිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.සිද්ධිය සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර නාල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**